**2022.10.14 වන දින පෙ.ව. 09.30 ට හපුතලේ ප්‍රාදේශීය සභාවේ**
**නව සභා රැස්වීම් ශාලාවේදී පැවති**
**හපුතලේ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීම් වාර්තාව**

**පැමිණීම**

| | | |
|---|---|---|
| 1. බී. කන්දසාමි මයා | - | ගරු සභාපති |
| 2. වයි.එම්.නිමල් අමරසිරි මයා | - | ගරු උපසභාපති |
| 3. එස්. සගාදේවන් මයා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 4. ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 5. කේ.එම්. විමලසිරි මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 6. ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 7. ගෝපාලන් මුරුගන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 8. එල්.එච්. ඉන්දික සම්පත් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 9. ඩී.සුදත් අරුණ රංජන මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 10. සවරිමුත්තු ප්‍රභාහර් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 11. එෆ්. වයලට් රෝස් මහත්මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 12. මාරප්පන් කන්දසාමි මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 13. තංගවේලු මහේන්ද්‍රන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 14. වේලුසාමි එලිල් අරසි මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 15. එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිණී |
| 16. ආර්.එල්.සුදර්ශන මහතා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |

**01.පසුගිය රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022.09.09 වන දින පවත්වන ලද මාසික මහ සභාවෙ හි මහ සභා වාර්තාව හා 2022-09-30 වන දින පැවති විශේෂ මහ සභාවෙ හි මහ සභා වාර්තාව කියවූවා සේ සළකා සභා සම්මත කිරීම සිදු කරන ලෙස ගරු මූලාසනය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විසින් පසුගිය මහ සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය මහ සභා රැස්වීම් වාර්තා ඒකමතිකව සභා සම්මත විය.

**02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

- ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය මගින් වියදම් කිරීමට නියමිත PPTA ක්‍රියාකාරකම් යටතේ දෙවන පියවර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම සඳහා කළ යුතු කාර්යයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව 2022-10-19 වන දින දියතලාව සංස්කෘතික මධ්‍යස්ථානයෙ හි පවත්වනු ලබන බව නිවේදනය කිරීම.

**03. සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන**

- <u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා</u>
  - කහගොල්ල බුදු මැදුර අසළ පවත්වාගෙන ගිය සංවර්ධන කුඩුවෙහි කුඩා වෙළඳ කුටියක් පවත්වාගෙන යාමට අවසර ලබා දෙන ලෙස ඉදිරිපත් කර ඇති ලිපිය

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා</u>

දියතලාව , හෙළකඳුරුගමුව ,දික්වත්තේ ගෙදර පදිංචි එස්. ටී. නිල්මිණී සුසන්තිකා මහත්මිය විසින් ශිෂ්‍යාධාර මුදලක් ලබා ගැනීම සම්බන්ධයෙන් යොමු කර ඇති ලිපිය

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. සගාදේවන් මහතා</u>

  අංක 09, ග්ලැනනොර් වත්ත , හපුතලේ ලිපිනයේ පදිංචි අංගමුත්තු මාරිඅම්මා මහත්මිය විසින් අවමංගල්‍යාධාර ලැබී නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් සොයා බලන ලෙසට යොමු කර ඇති ලිපිය

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා</u>

  පහළ කහත්තේවෙල ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ වාර්ෂික කඨින චීවර පිංකම 2022-10.22, 23 යන දිනයන් හි දී පැවැත්වීමට නියමිත බැවින් පහළ කහත්තේවෙල වැලිමඩ පාරේ සිට උඩුතුරේ දක්වා මාර්ගය පවිත්‍ර කර දෙන ලෙසට යොමු කර ඇති ලිපිය

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාහර් මහතා</u>

  කහගල්ල වයි හංදිය අසල ඇති ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණය කිරීමට මෙම වර්ෂය නිම වීමට පෙර බැකෝ යන්ත්‍රය ලබා දෙන ලෙසට යොමු කර ඇති ඉල්ලීම් ලිපිය

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

නැත

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා**

**යෝජනා අංක 01**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය මගින් වියදම් කිරීමට නියමිත PPTA ක්‍රියාකාරකම් යටතේ දෙවන පියවර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම වෙනුවෙන් කළ යුතු කාර්යයන් වෙනුවෙන් 2022-10-19 වන දින දියතලාව සංස්කෘතික මධ්‍යස්ථානයෙ හි පවත්වනු ලබන වැඩමුළුව සඳහා කමිටුවක් පත් කර ගැනීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා</u>

<u>විවාද</u>

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය මගින් වියදම් කිරීමට නියමිත PPTA ක්‍රියාකාරකම් යටතේ දෙවන පියවර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම වෙනුවෙන් කළ යුතු කාර්යයන් වෙනුවෙන් 2022-10-19 වන දින දියතලාව සංස්කෘතික මධ්‍යස්ථානයෙ හි පවත්වනු ලබන වැඩමුළුව සඳහා කමිටුවක් පත් කර ගැනීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී. ඒ සඳහා පහත සඳහන් කමිටුව තෝරා පත් කර ගන්නා ලදී.

- බී. කන්දසාමි මයා - ගරු සභාපති
- එස්. සගාදේවන් මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
- කේ.එම්. විමලසිරි මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
- ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
- ගෝපාලන් මුරුගන් මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
- ඩී.සුදත් අරුණ රංජන මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
- සවරිමුත්තු ප්‍රභාහර් මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
- එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී

- ග්‍රාම සේවා වසම් 26 නියෝජනය කරන ග්‍රාම සංවර්ධන සමිති ,කාන්තා සමිති , එක් සාමාජිකයකු බැගින්

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

දියතලාව ගල්කන්ද ගම හරහා දිවෙන හරස් මාර්ගය **ගල්කන්ද ආරන්‍ය මාවත** ලෙසින් නම් කර පුවරු යොදා දෙන ලෙසට ගල්කන්ද ගම්වාසීන් විසින් සිදු කර ඇති ඉල්ලීමට අනුව එකී හරස් මාර්ගය **ගල්කන්ද ආරන්‍ය මාවත** ලෙසින් නම් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා</u>

<u>විවාද</u>

දියතලාව ගල්කන්ද ගම හරහා දිවෙන හරස් මාර්ගය **ගල්කන්ද ආරන්‍ය මාවත** ලෙසින් නම් කර පුවරු යොදා දෙන ලෙසට ගල්කන්ද ගම්වාසීන් විසින් සිදු කර ඇති ඉල්ලීමට අනුව එකී හරස් මාර්ගය **ගල්කන්ද ආරන්‍ය මාවත** ලෙසින් නම් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

හපු/ ප්‍රාස /02 /05 අංක හා 2022.08.16 දිනැති ලිපිය ප්‍රකාරව පත් කරන ලද සාමාජිකයන්ගෙන් සැදුම්ලත් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් සිදු කරන ලද හපුතලේ ප්‍රාදේශීය සභාවේ විශේෂ භාණ්ඩ සමීක්ෂණය ( පැරණි පුස්තකාල ගොඩනැගිල්ල ගලවා ඉවත් කර ඇති ද්‍රව්‍ය සමීක්ෂණය) වාර්තාවෙ හි පහත සඳහන් නිර්දේශ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

I. ඉහත සඳහන් සියලු ද්‍රව්‍ය ආරක්ෂිතව ගබඩා කර තබා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.
II. නව ඉදි කිරීම් සිදු කරන භූමිය වටා ආරක්ෂිත වැටක් ලෙස සැකසීමට භාවිතා කර ඇති ඇස්බැස්ටස් ෂීට් ප්‍රමාණය සභාවේ අනුමැතිය මත ලිඛිතව කොන්ත්‍රාත්කරු වෙත තාවකාලිකව භාර දීම.
III. කොන්ත්‍රාතුව අවසානයේදී එම ඇස්බැස්ටස් ෂීට් ප්‍රාදේශීය සභාව වෙත නැවත භාර දීම කළ යුතු බවට එම ඇස්බැස්ටස් සීට්වල යම් හානියක් සිදුව ඇත්නම් කොන්ත්‍රාත්කරු ඊට වගකීමට යටත් වන ආකාරයට ලිඛිත එකඟතාවයට එළඹීම.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. එම්. විමලසිරි මහතා</u>

<u>විවාද</u>

හපු/ ප්‍රාස /02 /05 අංක හා 2022.08.16 දිනැති ලිපිය ප්‍රකාරව පත් කරන ලද සාමාජිකයන්ගෙන් සැදුම්ලත් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් සිදු කරන ලද හපුතලේ ප්‍රාදේශීය සභාවේ විශේෂ භාණ්ඩ සමීක්ෂණය ( පැරණි පුස්තකාල ගොඩනැගිල්ල

ගලවා ඉවත් කර ඇති ද්‍රව්‍ය සමීක්ෂණය) වාර්තාවෙ හි පහත සඳහන් නිර්දේශ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

I. ඉහත සඳහන් සියලු ද්‍රව්‍ය ආරක්ෂිතව ගබඩා කර තබා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.
II. නව ඉදි කිරීම් සිදු කරන භූමිය වටා ආරක්ෂිත වැටක් ලෙස සැකසීමට භාවිතා කර ඇති ඇස්බැස්ටස් ෂීට් ප්‍රමාණය සභාවේ අනුමැතිය මත ලිඛිතව කොන්ත්‍රාත්කරු වෙත තාවකාලිකව භාර දීම.
III. කොන්ත්‍රාතුව අවසානයේදී එම ඇස්බැස්ටස් ෂීට් ප්‍රාදේශීය සභාව වෙත නැවත භාර දීම කළ යුතු බවට එම ඇස්බැස්ටස් සීට්වල යම් හානියක් සිදුව ඇත්නම් කොන්ත්‍රාත්කරු ඊට වගකීමට යටත් වන ආකාරයට ලිඛිත එකඟතාවයට එළඹීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් වෙන්දේසිය පවත්වනු ලබන විට ගරු මන්ත්‍රී මණ්ඩලය දැනුවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

2022 වර්ෂයේ අයවැයගත ඇස්තමේන්තු මගින් වෙන් කරන ලද පහත සඳහන් වැය ශීර්ෂයන් හි ප්‍රතිපාදන ඉදිරි කාලය සඳහා ප්‍රමාණවත් නොවන බැවින් ලැබීමට නියමිත මුද්දර ආදායම් මුදල වන **රු.1,899,260.00**( දහඅට ලක්ෂ අනූනව දහස් දෙසීය හැටක් ) ක අයවැය ගත නොවූ ආදායමට පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

| අනු අංකය | වැය විෂය | 2022 අයවැය ලේඛනය මගින්වෙන් කර ඇති මුදල | අමතරව වෙන් කර ඇති ප්‍රතිපාදන | 2022.8.31 දිනට සත්‍ය වියදම | ඉතිරි මුදල | පරිපූරක ඇස්තමේන්තුව මගින් සලසා ගැනිමට අපේක්ෂිතප්‍රතිපාදන ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| 1 | 103/02-ඉන්ධන ස්නේහක තෙල්(කැබ් රථ) | 800,000.00 | 700,000.00 | 1,068,722.00 | 431,278.00 | 500,000.00 |
| 2 | 104/02-සභා කැබ් රථය අලුත්වැඩියා හා වාර සේවා කිරීම | 750,000.00 | | 620,933.15 | 129,066.85 | 330,000.00 |
| 3 | 105/03කාර්යාල දුරකතන ගාස්තු | 100,000.00 | | 84,485.78 (2022-07-31 දිනට) | 15,514.22 | 100,000.00 |
| 4 | 105/05-කාර්යාල විදුලි බිල්පත් | 100,000.00 | | 74,533.70 | 25,466.30 | 75,000.00 |
| 5 | 105/11-මුද්‍රණ කටයුතු | 25,000.00 | | 24,206.70 | 793.30 | 20,000.00 |
| 6 | 203/01-ට්‍රැක්ටර් සඳහා ඉන්ධන | 500,000.00 | 137,000.00 | 260,942.00 | 239,058.00 | 150,000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 7 | 204/02-ට්‍රැක්ටර් අලුත්වැඩියා හා සේවා කිරීම | 250,000.00 | | 215,034.00 | 34,966.00 | 150,000.00 |
| 8 | 205/02-පොදු ජල ටැංකි හා වැසිකිළිවල ජල බිල්පත් | 50,000.00 | | 31,082.48 | 18,917.52 | 5,000.00 |
| 9 | 303/02-බැකෝ යන්ත්‍රය සඳහා ඉන්ධන | 300,000.00 | 100,000.00 | 266,923.00 | 133,077.00 | 150,000.00 |
| 10 | 304/02-බැකෝ යන්ත්‍රය අලුත් වැඩියාව | 250,000.00 | | 249,104.76 | 895.24 | 300,000.00 |
| 11 | 605/04-සංග්‍රහ වියදම් | 150,000.00 | 100,000.00 | 162,822.00 | 87,178.00 | 109,260.00 |
| | | | | | | |
| | | | | | | **1,889,260.00** |

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල් සුදර්ශන මහතා

විවාද

2022 වර්ෂයේ අයවැයගත ඇස්තමේන්තු මගින් වෙන් කරන ලද පහත සඳහන් වැය ශීර්ෂයන් හි ප්‍රතිපාදන ඉදිරි කාලය සඳහා ප්‍රමාණවත් නොවන බැවින් ලැබීමට නියමිත මුද්දර ආදායම් මුදල වන රු.**1,899,260.00**( දහඅට ලක්ෂ අනූනව දහස් දෙසීය හැටක් ) ක අයවැය ගත නොවූ ආදායමට පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

| අනු අංකය | වැය විෂය | 2022 අයවැය ලේඛනය මගින්වෙන් කර ඇති මුදල | අමතරව වෙන් කර ඇති ප්‍රතිපාදන | 2022.8.31 දිනට සත්‍ය වියදම | ඉතිරි මුදල | පරිපූරක ඇස්තමේන්තුව මගින් සලසා ගැනිමට අපේක්ෂිතප්‍රතිපාදන ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| 1 | 103/02-ඉන්ධන ස්නේහක තෙල්(කැබ් රථ) | 800,000.00 | 700,000.00 | 1,068,722.00 | 431,278.00 | 500,000.00 |
| 2 | 104/02-සභා කැබ් රථය අලුත්වැඩියා හා වාර සේවා කිරීම | 750,000.00 | | 620,933.15 | 129,066.85 | 330,000.00 |
| 3 | 105/03කාර්යාල දුරකතන ගාස්තු | 100,000.00 | | 84,485.78 (2022-07-31 දිනට) | 15,514.22 | 100,000.00 |
| 4 | 105/05-කාර්යාල විදුලි බිල්පත් | 100,000.00 | | 74,533.70 | 25,466.30 | 75,000.00 |
| 5 | 105/11-මුද්‍රණ කටයුතු | 25,000.00 | | 24,206.70 | 793.30 | 20,000.00 |
| 6 | 203/01-ට්‍රැක්ටර් සඳහා ඉන්ධන | 500,000.00 | 137,000.00 | 260,942.00 | 239,058.00 | 150,000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 7 | 204/02-ට්‍රැක්ටර් අලුත්වැඩියා හා සේවා කිරීම | 250,000.00 | | 215,034.00 | 34,966.00 | 150,000.00 |
| 8 | 205/02-පොදු ජල ටැංකි හා වැසිකිළිවල ජල බිල්පත් | 50,000.00 | | 31,082.48 | 18,917.52 | 5,000.00 |
| 9 | 303/02-බැකෝ යන්ත්‍රය සඳහා ඉන්ධන | 300,000.00 | 100,000.00 | 266,923.00 | 133,077.00 | 150,000.00 |
| 10 | 304/02-බැකෝ යන්ත්‍රය අලුත් වැඩියාව | 250,000.00 | | 249,104.76 | 895.24 | 300,000.00 |
| 11 | 605/04-සංග්‍රහ වියදම් | 150,000.00 | 100,000.00 | 162,822.00 | 87,178.00 | 109,260.00 |
| | | | | | | |
| | | | | | | **1,889,260.00** |

මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීම.

යෝජනා කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා

කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීම.

යෝජනා කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්.නිමල් අමරසිරි මහතා

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 05**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

පළාත් පාලන කොමසාරිස්තුමන්ගෙන් ලද 2022-09-22 දිනැති 12/01/16/02 අංක දරණ පලාත් පාලන ආයතනවල අත්‍යවශ්‍ය නිවාඩු දිනවල සේවයේ නිරත වීම වෙනුවෙන් නිවාඩු දින වැටුප් ලබා දීම යන ලිපිය ප්‍රකාරව පළාත් පාලන ආයතන පාර්ලිමේන්තුව මගින් සම්මත කර ඇති නීතියක් මගින් බිහිකර ඇති ව්‍යවස්ථාපිත ආයතනයක් වන හෙයින් ද මෙම ආයතනය මහජන නියෝජිත ආයතනයනක් වන හෙයින් ද පලාත් පාලන ආයතනයන් හි සේවයේ නියුතු නාගරික කොමසාරිස්, නාගරික ලේකම් හා සභා ලේකම්වරුන් වෙත පැවරී ඇති කාර්යයන් සහ බලතලවල ස්වභාවය හේතුවෙන් සතියේ ප්‍රසිද්ධ නිවාඩු දින හා සති අන්ත නිවාඩු දිනවල සේවයේ නිරතවීමට සිදු වන බැවින් 2022 ජූලි මස සිට දින 05ක උපරිමයකට යටත්ව නිවාඩු දින වැටුප් ලබා දීම අනුමත කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා

විවාද

පළාත් පාලන කොමසාරිස්තුමන්ගෙන් ලද 2022-09-22 දිනැති 12/01/16/02 අංක දරණ පලාත් පාලන ආයතනවල අත්‍යවශ්‍ය නිවාඩු දිනවල සේවයේ නිරත වීම වෙනුවෙන් නිවාඩු දින වැටුප් ලබා දීම යන ලිපිය ප්‍රකාරව පළාත් පාලන ආයතන පාර්ලිමේන්තුව මගින් සම්මත කර ඇති නීතියක් මගින් බිහිකර ඇති ව්‍යවස්ථාපිත ආයතනයක් වන හෙයින් ද මෙම ආයතනය මහජන නියෝජිත ආයතනයනක් වන හෙයින් ද පලාත් පාලන ආයතනයන් හි සේවයේ නියුතු නාගරික

කොමසාරිස්, නාගරික ලේකම් හා සභා ලේකම්වරුන් වෙත පැවරී ඇති කාර්යයන් සහ බලතලවල ස්වභාවය හේතුවෙන් සතියේ ප්‍රසිද්ධ නිවාඩු දින හා සති අන්ත නිවාඩු දිනවල සේවයේ නිරතවීමට සිදු වන බැවින් 2022 ජූලි මස සිට දින 05ක උපරිමයකට යටත්ව නිවාඩු දින වැටුප් ලබා දීම අනුමත කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 06**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

2022 නොවැම්බර් මස මහ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්.නිමල් අමරසිරි මහතා</u>

<u>විවාද</u>

2022 නොවැම්බර් මස මහ සභාව පැවැත්වෙන දිනය ලෙස නොවැම්බර් මස 10 වන බ්‍රහස්පතින්දා දිනය තීරණය කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 07**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

හපුතලේ ප්‍රාදේශීය සභා බහු කාර්යය ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු සම්බන්ධව බිම් මහල ආසන්නයේ ඇති පඩිපෙළ හේතුවෙන් ගොඩනැගිල්ල භාවිතා කරන වර්ග ප්‍රමාණය අඩුවීම හා පඩිපෙළ බාහිරට දර්ශනය වීම අඩුවීමත් හේතුවෙන් ගොඩනැගිල්ල දකුණු පස ඉඩ ප්‍රමාණයේ පඩිපෙළ ඉදි කිරීම සඳහා සලකා බැලීම, ගොඩනැගිල්ල පාමහලෙන් (වාහන නැවතුම) පළමු මහල වෙත පිවිසීම සඳහා පඩිපෙළක් සකස් කිරීම , ගොඩනැගිල්ලෙ හි බිම් මහළ සඳහා වැසිකිළි හා සනීපාරක්ෂක පද්ධතියක් ගොඩනැගිල්ලට බාහිරින් තැනීම සඳහා සලකා බැලීම යන එකතු කිරීම් සිදු කළ යුතු නමුදු මේ වන විට සකසා ඇති සැලසුම තුළ එකී කරුණු අඩංගු නොවන බැවින් සැලසුම සංශෝධනය කිරීම ද ඇස්තමේන්තු කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් එකී කටයුතු සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීමට පළාත් පාලන දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් යොමු කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්.නිමල් අමරසිරි මහතා</u>

<u>විවාද</u>

හපුතලේ ප්‍රාදේශීය සභා බහු කාර්යය ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු සම්බන්ධව බිම් මහල ආසන්නයේ ඇති පඩිපෙළ හේතුවෙන් ගොඩනැගිල්ල භාවිතා කරන වර්ග ප්‍රමාණය අඩුවීම හා පඩිපෙළ බාහිරට දර්ශනය වීම අඩුවීමත් හේතුවෙන් ගොඩනැගිල්ල දකුණු පස ඉඩ ප්‍රමාණයේ පඩිපෙළ ඉදි කිරීම සඳහා සලකා බැලීම, ගොඩනැගිල්ල පාමහලෙන් (වාහන නැවතුම) පළමු මහල වෙත පිවිසීම සඳහා පඩිපෙළක් සකස් කිරීම , ගොඩනැගිල්ලෙ හි බිම් මහළ සඳහා වැසිකිළි හා සනීපාරක්ෂක පද්ධතියක් ගොඩනැගිල්ලට බාහිරින් තැනීම සඳහා සලකා බැලීම යන එකතු කිරීම් සිදු කළ යුතු නමුදු මේ වන විට සකසා ඇති සැලසුම තුළ එකී කරුණු අඩංගු නොවන බැවින් සැලසුම සංශෝධනය කිරීම ද ඇස්තමේන්තු කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් එකී කටයුතු සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීමට පළාත් පාලන දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් යොමු කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** කාරක සභා වර්තාව

2022.10.04 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 සැප්තැම්බර් මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**08.වෙනත් කරුණු**

**08.1 ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.සී. කිත්සිරි පෙරේරා මහතා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එම්. ඒ. නිල්මිනී චන්ද්‍රකාන්ති මහත්මිය අසනීප නිවාඩු ලබා ඇති බැවින් 2022-10-14 වන දින සභාවට සහභාගී නොවීම සම්බන්ධයෙන් ගරු සභාව විසින් එකී සභිකයන් වෙත අසනීප නිවාඩු ලබා දීම සුදුසු බවට එකඟතාවය පළ කරන ලදී.

**<u>08.2 ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම.</u>**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාගර් මහතා අදහස් දක්වමින් පසුගිය දා කනවැරැල්ල වත්තෙ හි විදුලි වැටකට හසු වී වයස අවුරුදු 24 ක තරුණයෙකු ජීවිතක්ෂයට පත් වී ඇති අතර ඒ සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරන බව පළමුවෙන් ම සඳහන් කරන ලදී.එසේ ම මෙවැනි සිදු වීම් හපුතලේ බල ප්‍රදේශයට අයත් වතුවල මින් ඉදිරියට සිදු නොවීම සඳහා වතු කළමනාකරුවන් දැනුවත් කරන මෙන් ප්‍රකාශ කරන ලදී.එසේම මෙම දිනවල පවතින අධික වර්ෂාව හේතුවෙන් වතු කම්කරුවන්ගේ සේවා අවසන් වන වේලාව පස්වරු 2.00 දක්වා අඩු කරන ලෙසට වතු කළමනාකාරීත්වයෙන් ඉල්ලීමක් සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.එසේ ම වතු කම්කරුවන්හට විෂ කෘමීන් හා කූඩැල්ලන් හේතුවෙන් විවිධ සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දීමට සිදු වන බවත් වතු කළමනාකාරීත්වය මේ සම්බන්ධව සැලකිලිමත් නොවන බැවින් මේ සම්බන්ධයෙන් හපුතලේ ප්‍රාදේශීය සභාව අවධානයෙන් පසුවන බවට වතු කළමනාකාරීත්වය දැනුවත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.එසේම කම්කරුවන් සඳහා දෛනික වැටුප රු.1000.00 ක් ලබා දෙන ලෙසට වතු කළමනාකාරීත්වයෙන් කම්කරුවන් ඉල්ලීම් කල පසු කළමනාකාරීත්වය විසින් කම්කරුවන් පීඩාවට පත් කරමින් වැඩ පැවරීම සිදු කරන බැවින් ඒ සඳහා තම විරෝධය ප්‍රකාශ කරන බව සඳහන් කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් සභා කටයුතු වාර්තා කිරීම සඳහා පැමිණෙන මාධ්‍යවේදී මහතා බොහෝ දිනකින් සභා කටයුතු සඳහා සම්බන්ධ නොවුණු බවත් ප්‍රජාව විසින් පත්තර බැලීම සිදු කරන බැවින් සභාවෙන් සිදු කරන කාර්යයන් පිළිබඳ අවධානයෙන් පසුවීම හේතුවෙන් සභා කටයුතු පවත්වාගෙන යාමේ දී ඒ සඳහා මාධ්‍යවේදියෙකු සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.
එසේම මෙම දිනවල පවතින අධික වර්ෂාව හේතුවෙන් දඹේතැන්න මාවුස්සාකැලේ වතු ප්‍රජාව බොහෝ අසීරුතාවයට පත් වී ඇති බවත් මේ සම්බන්ධයෙන් මේ වනතුරු සාධාරණයක් ලැබී නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීමට මහජන නියෝජිතයන් ලෙස ප්‍රජාව සමඟ එක් විය යුතු බවත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළ යුතු බවත් 2022-10-16 වන දින මාධ්‍ය වාර්තාකරුවන් සමඟ එකී ස්ථානයට ගොස් මේ සම්බන්ධයෙන් මුළු දිවයින පුරා දැනුවත් වන ආකාරයෙන් සාකච්ඡා සිදු කිරීම සුදුසු බවත් ගරු සභාපතිතුමන් ඒ සඳහා මැදිහත් වන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගෝපාලන් මුරුගන් මහතා මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් මෙකී නිවාස ව්‍යාපෘතියෙන් එක් නිවසක් සඳහා ලක්ෂ 16ක මුදලක් වෙන් වී තිබූ බවත්, ලක්ෂ 16ක ප්‍රතිපාදන යටතේ මෙකී නිවාස ව්‍යාපෘති හිමිවන්නේ නම් එය නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක කළ යුතු නිවාස ව්‍යාපෘතියක් වුවද මෙකී ව්‍යාපෘතිය ආපදා කළමණාකරණ අංශය යටතේ ආරම්භ කොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මක වූ බැවින් මේ වන විට ගැටළු පැන නැගී ඇති බවත් ව්‍යාපෘතියට අදාළ නිවාස ඉදිකිරීමේදී ඉඩම වෙන් කිරීම සඳහා ලක්ෂ 04ක මුදලක් වෙන් වී තිබූ බවත්

ලක්ෂ 04 බැගින් නිවෙස් 66ක් සඳහා වන ප්‍රතිපාදන මුදල ඉඩම වෙන් කිරීමෙන් පසු වතු සමාගමට ගෙවා අවසන් කර තිබේද එසේ නොමැති නම් වෙනත් බාහිර පාර්ශවයක් විසින් පෞද්ගලිකව එකී මුදල් ලබාගෙන තිබේද, එකී මුදලට සිදු වූයේ කුමක්ද යන්න මේ වන විටත් නිසි පිළිතුරක් ලැබී නොමැති බවත් මෙකී ව්‍යාපෘතිය ආරම්භ කරන විට ඉඩම සැකසීම සඳහා ලක්ෂ 12ක ප්‍රතිපාදන මුදලක් එක් නිවසක් සඳහා වෙන් කර තිබූ බවත් පර්චස් 3.5 ලෙස භූමිය සකස් කර පර්චස් 07ක් ලෙස පෙන්වා ඉඩම නිසි ප්‍රමිතියට පවා සකස් නොකර එකී මුදල් ද ගෙවා අවසන් කර ඇති බවත් මෙකී ව්‍යාපෘතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදුකළ අතර, ගෙවීම් සිදුකිරීමේදී කාර්මික නිලධාරීතුමාගේ නිර්දේශය මත මේ වන විට ව්‍යාපෘතියට වෙන්වූ මුදලින් මුදල් මේ වන විට ගෙවා අවසන් කර ඇති බවත් මේ සියල්ලම සිදු වූයේ දේශපාලනික වාතාවරණය හමුවේ ආණ්ඩු මාරු වීමත් සමඟ බවත් නිවාස ව්‍යාපෘතියට අදාළ ඉදිරි කටයුතු පවත්වාගෙන යා හැකිද යන කරුණු පිළිබඳ අවධානය යොමුකර විගණන අංශ හෝ දැනුවත් කර මේ සම්බන්ධයෙන් විමර්ෂණයක් සිදු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් 2022-10-16 වන දින ගරු මන්ත්‍රී මණ්ඩලය සමඟ මාධ්‍ය රැගෙන එකී ස්ථානයට ගොස් මේ සම්බන්ධයෙන් පුළුල් ලෙස ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම සිදු කළ යුතු බවත් ඉදිරියේ දී පැවැත්වෙන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සඳහා තමන් සමඟ මහජන නියෝජිතයන් දෙදෙනෙකු හෝ සහභාගි වීමට කටයුතු සිදු කිරීම සුදුසු බවත් එහිදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සිදු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් මේ දිනවල පවතින වර්ෂාව හේතුවෙන් අකුණු ගැසීම සිදු වන බැවින් වතු කම්කරුවන් ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සැලකිලිමත් වන ලෙස වතු කළමනාකාරීත්වය දැනුවත් කරන ලෙසත් ගල්කන්ද වතුතෙහි ගසන ලද උගුල්වලට කොටි පැටවුන් දෙදෙනෙකු පසුගිය දා අසුවී ඇති බවත් ග්ලැනනෝර් දෙමළ මහා විද්‍යාලයේ නයි තිදෙනෙකු සිටින බැවින් මේ සම්බන්ධයෙන් වන ජීවී දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වී. එලීල් අරසි මහත්මිය අදහස් ප්‍රකාශ කරමින් පිටරත්මලේ වත්තට අයත් සමෘද්ධි කණ්ඩායමේ සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික තිදෙනා එක් වී රු.500.00 බැගින් මුදලක් ලබා ගත් බවට අසත්‍ය ප්‍රචාරයක් පැතිර යන බවත් මින් ඉදිරියේ දී ගනුදෙනු සිදු කිරීමේ දී සමෘද්ධි කණ්ඩායමේ සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තිදෙනා ඇතුළු සමෘද්ධි නිලධාරීන් දැනුවත් කළ යුතු බව පසුගිය සභාවේ දැනුවත් කළ පසුව සමෘද්ධි කණ්ඩායමට අයත් නොවන පිරිමි පුද්ගලයෙක් හා ගැහැනියක් එක් වී පිටරත්මලේ අංක 02 පාසලේ පැරණි ගොඩනැගිල්ලෙහි සමෘද්ධි ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කර ඇති බවත් ඒ සඳහා එක් පුද්ගලයෙක්ගෙන් රු.300.00ක මුදලක් ලබා ගෙන ඇති බවත් කහ පැහැති කාඩ්පතක් ලබා දෙනවා යැයි පවසා ඒ සඳහා රු.100.00 ක මුදලක් ලබා ගෙන ඇති බවත් ප්‍රකාශ කළ අතර එකී ගොඩනැගිල්ල එම කටයුතු සඳහා ලබා දීම සිදු කරනු ලැබුවේ කවුරුන් විසින් ද ලබා ගැනීම සිදු කරන ලද්දේ කවුරුන් විසින් ද යන්න තමා නොදැනුවත් බැවින් පිටරත්මලේ අංක 02 පාසලේ විදුහල්පතිතුමාගෙන් විමසීම සිදු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී. එසේම කනවරැල්ල වත්තේ මෙන්ම තොටලාගල වත්තේ ද බඹර ප්‍රහාරයක් හේතුවෙන් කාන්තාවක් මිය ගොස් ඇති බැවින් මෙවැනි හානි සම්බන්ධයෙන් ලිපි යොමු කිරීම සිදු නොකර සියලුම වතු කළමණාකරුවන් ඒකරාශී කර සාකච්ඡාවක් පැවැත්වීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඉංදික සම්පත් මහතා අදහස් දක්වමින් දියතලාව ප්‍රධාන බස් නැවතුම්පොළ භූමියෙහි තිබූ වළවල් පිළිසකර කිරීම සම්බන්ධයෙන් තම ස්තූතිය ප්‍රකාශ කරන බවත් කසළ බඳුන් තබා නගරය පිරිසිදුව තබා ගැනීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ස්තූතිය ප්‍රකාශ කරන බවත් නගරයේ නව දෙමහල් ගොඩනැගිල්ලේ විදුලි බල්බ කිහිපයක් අක්‍රිය වී ඇති බැවින් අයථා කටයුතු සිදු වීමට ඉඩකඩ ඇති බැවින් එකී විදුලි පහන් අලුත්වැඩියා කිරීම සඳහා කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා අදහස් දක්වමින් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ගෙවනු ලබන වැඩිහිටි දීමනාව මෙම දිනවල ප්‍රතිලාභීන් හට ගෙවනු ලබන්නේ සමෘද්ධි බැංකුව හරහා බැවින් වැඩිහිටි දීමනාව ලබා ගන්නා පුද්ගලයින් ප්‍රවාහන අපහසුතා හේතුවෙන් බොහෝ අපහසුතාවයට ලක් වන බැවින් මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්තුමන් දැනුවත් කිරීම සුදුසු බවත් මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමේදී සාකච්ඡා කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.
එසේම සභාවට අයත් කඩපේළියෙහි කඩවල් සඳහා ඇතැම් අවස්ථාවලදී වෙළදාම් නොමැති වීම නිසා කඩකුලී ගෙවීමට පවා නොහැකි තත්ත්වයට පත් වී ඇති බැවින් එකී පුද්ගලයන් සඳහා සහනයක් ලබා දෙන ලෙසට ප්‍රකාශ කළ අතර ගරු

සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් කඩ පවත්වාගෙන යාම සිදු කරන්නේ කඩහිමියන් විසින් නොව එකී කඩ කුලී පදනම මත ලබා ගත් පුද්ගලයන් බවත් එබැවින් කඩහිමියන්ගෙන් කුලී අය කිරීම සිදු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී. කහත්තේවෙල කාපට් මාර්ගයට ගස් කොටන් කපා දමා ඇති බවත් එලෙස ගස් කැපීමට සභාවෙන් අවසර ලබා ගෙන තිබේද යන්නත් මෙම කොටන් හේතුවෙන් කාණු පද්ධතිය වැසී ජලය මාර්ගය හරහා ගලා යාමෙන් මාර්ගය විනාශවීමට ලක් වී ඇති බැවින් මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් කාර්මික නිලධාරිමහතා දැනුවත් කරන ලෙසත් එකී වාර්තාව පරිදි අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. සගාදේවන් මහතා අදහස් දක්වමින් ග්ලැනනෝර් වතුයායේ නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ලද නිවාස සඳහා වර්ෂයකට පමණ ඉහත ජලය ලබා ගැනීම වෙනුවෙන් මුදල් වෙන් කළද  මේ වන තෙක් ජලය නොලැබී ඇති බවත් විමසීම් සිදු කළ විට කුමන හෝ හේතුවක් පවසන බවත් ජලය ලබා දීමට අවශ්‍ය කටයුතු කඩිනම් කර දෙන ලෙසත් එසේම විදුලි බල මණ්ඩලයෙන් විදුලිය ලබා ගැනීම සඳහා බොහෝ දෙනෙකු ඉල්ලුම්පත්‍ර යොමු කර තිබුණ ද විදුලි මීටර් හිඟතාවය හේතුවෙන් විදුලිය ලබා දීම සිදු නොකරන බවත් මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්  ප්‍රකාශ කරන ලදී.එසේම වතු වල රාජකාරී කටයුතු සිදු කිරීමේ දී සියලු වතු කම්කරුවන් එකමුතුවී කටයුතු සිදු කළ යුතු බවත් ග්ලැනනෝර් වත්තෙහි කම්කරුවන් සියලු දෙනා එකමුතු වී කටයුතු කරන බැවින් පරිපාලනය විසින් සහයෝගය ලබා දෙන බවත් වෙනත් වතුවල එසේ එකමුතුභාවයක් නොමැතිවීම හේතුවෙන් විවිධ ගැටලු පැන නගින බවත් දේශපාලන මතිමතාන්දර වලට අනුව නොව මිනිසුන්ගේ ප්‍රශ්න වෙනුවෙන් කටයුතු සිදු කළ යුතු බවත් අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙන් කටයුතු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.එසේම කනවරැල්ල වත්ත පසුගිය දිනක මිය ගිය තරුණයා වෙනුවෙන් ගරු සෙන්දිල් තොණ්ඩමන් මහතා විසින් වතු කළමණාකාරීත්වය සමඟ සාකච්ඡා කර එකී තරුණයා ජීවිත කාලයම වැඩකර උපයන මුදල ලෙසට ඇස්තමේන්තු කළ රුපියල් එක්කෝටි ලක්ෂ දෙකක පමණ මුදලක් වතු කළමණාකාරීත්වයෙන් ලබා ගැනීමට මේ වන විට කටයුතු  කරමින් පසු වන බවත් එය ජයග්‍රහනය කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.එසේම සමෘද්ධි ප්‍රතිලාභය දීපවාලී පැවැත්වෙන බැවින් 2022-10-24 වන දිනට ප්‍රථම ලබා දීමට අවශ්‍ය කටයුතු කරන මෙන් ප්‍රකාශ කරන ලදී.

මෙදින සභා රැස්වීම ප.ව.12.00ට අවසන් විය.

බී.කන්දසාමි,<br>
සභාපති,<br>
හපුතලේ ප්‍රාදේශීය සභාව,<br>
දියතලාව.